# ස්වයං අකර්මණ්‍ය සිරින්ජර ගබඩා කිරීමේ දී ප්‍රවාහනයේ දී හා භාවිතයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

## අ: ගබඩා කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

1. සෑමවිටම පිරිසිදු, වියළි, කෘමීන්ගෙන් තොර වාතාශ්‍රය හොඳින් ලැබෙන ස්ථානවල ගබඩා කළ යුතුය.

2. සිරින්ජර අධික තාපයට හෝ කෙළින් ම හිරු එළියට නිරාවරණය නොකළ යුතුය. එසේ කිරීමෙන් සිරින්ජරයේ පොලිතින් හා කඩදාසි ආවරණය දුර්වර්ණවීම හා තාපයට සංවේදී කොටස් විනාශ වීම සිදුවිය හැක.

3. ආම්ලික ද්‍රාවක හෝ විශේෂයෙන් ම ලෝහමය කොටස් දියකළ හැකි රසායනික ද්‍රව්‍ය අසල සිරින්ජර ගබඩා නොකළ යුතුය. එසේ කිරීමෙන් සිරින්ජරයේ ලෝහමය කොටස් මලකඩ කෑම, දිරාපත්වීම සිදුවිය හැක.

4. සිරින්ජර අඩංගු පෙට්ටි කෙළින් ම පොළව මත නොතැබිය යුතු අතර ලී හෝ යකඩ රාක්ක මත ඒවා ගබඩා කළ යුතුයි. සිරින්ජර පෙට්ටි කෙළින් ම පොළව මත තැබීමෙන් ඒවාට තෙතමනය උරා ඒ මත පුස් වර්ග හා දිලීර වර්ධනය සිදුවිය හැක. තවද පෙට්ටි තුළට කෘමීන් ඇතුළු වී සිරින්ජර ආවරණවලට හානි කිරීමෙන් ඒවා හි ජීවානුහරණ තත්වය නැතිවිය හැක.

5. සිරින්ජර පෙට්ටි රාක්ක මත ගබඩා කිරීමේදී කුහුඹුවන්ට හා අනෙක් කෘමින්ට පහසුවෙන් ඒ මතට පැමිණීමට නොහැකිවන පරිදි බිත්තිය හා පෙට්ටි අතර අවම වශයෙන් අඟල් 6ක දුරක් තිබෙන පරිදි ගබඩා කළ යුතුය.

6. පෙට්ටි හැසිරවීමට හා නිතර ඒවා පරීක්ෂාකර බැලීමට පහසු උසක (අඩි 6-7ක් පමණ) දක්වා පමණක් සිරින්ජර පෙට්ටි එක මත එක ගබඩා කළ යුතුය.

7. සිරින්ජර පෙට්ටි පරීක්ෂා කිරීමට හා පහසුවෙන් හැසිරවීමට හැකි පරිදි සෑම පෙට්ටි ගොඩවල් දෙකක් අතර ගමන් කිරීමට හැකි පරිදි පටු ඉඩ තීරුවක් තිබිය යුතුය.

8. සිරින්ජර පෙට්ටි එසවීම හා බෑම සඳහා කොකු හෝ තියුණු තුඩ සහිත එසවීමේ හා බෑමේ උපකරණ භාවිතා නොකළ යුතුයි. එමගින් පෙට්ටිවලට හා සිරින්ජරවල ජීවාණුහරිත ආවරණ වලට හානිවිය හැක.

10. සිරින්ජර පෙට්ටි ගබඩා කිරීමේ දී විවිධ වර්ගයේ සිරින්ජර පෙට්ටි එකට ගබඩා නොකළ යුතුය. ප්‍රථමයෙන් ලැබුනු තොග පළමුව භාවිතයට ගත යුතු අතර එසේ කිරීමට පහසුවන පරිදි නිශ්පාදිත දිනය, කල් ඉකුත් වන දිනය හා කාණ්ඩ අංකය අනුව සිරින්ජර පෙට්ටි වෙන වෙනම පේලි වශයෙන් ගබඩා කළ යුතුය.

11. කල් ඉකුත් වීමට ආසන්න සිරින්ජර තොග තිබේදැයි නිතර විමසිලිමත් විය යුතු අතර ඒවා කල් ඉකුත් වීමට පෙර භාවිතයට ගැනීමට පියවර ගත යුතුය.

12. විවෘත කළ හෝ අඩක් භාවිතා කළ සිරින්ජර පෙට්ටි වෙන වෙනම තැබිය යුතු අතර එවැනි පෙට්ටිවල ඇති සිරින්ජර භාවිතා කර අවසන්වීමට පෙර නව සිරින්ජර පෙට්ටි විවෘත නොකළ යුතුය.

13. අවම වශයෙන් මසකට වරක් මෙම සිරින්ජර ගබඩා කර ඇති ගබඩා කාමර, රාක්ක හා අල්මාරි පිරිසිදු කළ යුතු අතර, තෙත්වීම්, පුස් හා කෘමි ආසාදන පිළිබඳව පරීක්ෂාකර බලා ඒවා අවම කරගැනීමට පියවර ගත යුතු අතර කෘමින් හා මීයන් මර්දනය සඳහා සුදුසු ක්‍රියාමාර්ග අවශ්‍ය සෑමවිටම ගත යුතුය.

## ආ: ප්‍රවාහනයේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

1. ජීවානුහරණීකෘත සිරින්ජර ආවරණය කර ඇත්තේ තුනී පොලිතින් හා කඩදාසි වලින් කළ ඇසුරුමක බැවින්, ඒවා එන්නත් බහාලූ පෙට්ටි වලින් ඉවතට ගත යුතුවන්නේ එන්නත ලබා දෙන අවස්ථාවේ දී පමණි.

2. ස්වයං අකර්මණ්‍ය සිරින්ජර සෑම අවස්ථාවකදීම (විශේෂයෙන්ම සෞ.වෛ.නි. කාර්යාලයේ සිට ක්ෂෙත්‍ර සායන දක්වා ප්‍රවාහනය කිරීමේදී) ඒවා බහාලූ පෙට්ටි තුළ පමණක් ප්‍රවාහනය කළ යුතු අතර, සිරින්ජර වෙනම අතින් හෝ, වෙනත් බෑග්/බහාලුම් තුළ දමා ප්‍රවාහනය නොකළ යුතුය. එසේ කිරීමේදී සිරින්ජරයේ පොලිතින්/කඩදාසි ආවරණය පළුදු වී සිරින්ජරවල ජීවානුහරණීකෘතභාවයට හානි විය හැක.

## ඇ: භාවිතයේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

1. සෞ.වෛ.නි. කාර්යාලවල හා සායනවල සිරින්ජර පෙට්ටි හැකි සෑමවිටකම පිරිසිදු අල්මාරියක ගබඩා කළ යුතු අතර, ඒ සමග පුස්, කාවුන් හා අනෙක් කෘමීන් පහසුවෙන් ඇදගතහැකි පොත්පත්, සඟරා හා වෙනත් කඩදාසි සමග ගබඩා නොකළ යුතුය.

2. තම ආයතනයේ ගබඩා කර ඇති ස්වයං අකර්මණ්‍ය සිරින්ජර නිරතුරුව අධීක්ෂනයට ලක් විය යුතු අතර, ඒවායේ වර්ණය වෙනස්වීමක්, පුස් බැඳීමක්, කෘමි ආසාදනයක් හෝ ආවරණයේ පළුදු වීම් ගැන පරීක්ෂා කළ යුතුය. ඉහත තත්වය පිළිබඳ සැකයක් ඇත්නම් එම සිරින්ජර භාවිතා නොකළ යුතු අතර තම අධීක්ෂණ නිළධාරියාගේ උපදෙස් පැතිය යුතු ය.

3. ආයතනයෙන් සිරින්ජර අඩංගු පෙට්ටි නිකුත් කිරීමට පෙර ඒවා ඇර බලා, ඉහත අංක 01හි සඳහන් කරුණු ගැන පරීක්ෂාකාරි විය යුතුය. ජීවානුහරිතභාවය පිළිබඳ සැකයක් ඇත්නම්, එම සිරින්ජර භාවිතා නොකළ යුතු අතර, අධීක්ෂණ නිළධාරීන්ගේ උපදෙස් පැතිය යුතුය.

4. එන්නත්ලාභියෙකුට එන්නත් ලබාදෙන අවස්ථාව තෙක් සිරින්ජරය බහාලූ පෙට්ටියෙන් ඉවතට නොගත යුතු ය.

5. කිසිවිටෙකත් අතින් අල්ලන ලද සිරින්ජර, පෙට්ටියෙන් ඉවතට ගෙන යම් වේලාවක් මේස මත තැබූ සිරින්ජර හෝ අතේ හෝ වෙනත් බහාලුමක දැමූ සිරින්ජර නැවත මුල් සිරින්ජර පෙට්ටියට නොදැමිය යුතු ය.

6. පසුව වාර්තා හා තොරතුරු ලබා ගැනීම පහසුවන පරිදි සිරින්ජර ලබා ගැනීමේදී හා නිකුත් කිරීමේදී දෙනු ලබන කුවිතාන්සි හා නිකුත් කිරීමේ ලේඛණ, කාණ්ඩ අංක, නිශ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය සහිතව නිසි අයුරින් පවත්වාගෙන යායුතුය.